හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

වෙළුම 47
2023 සිවුවන කලාපය
ISSN 1991- 0040 X

# ගොවිකටයුතු පුවත් හසුන



## චීනයේ හොන්ග්හෙ විශ්වවිද්‍යාලයේ නියෝජිතයින් සහ HARTI ආයතනය අතර සාකච්ඡා

චීනයේ හොන්ග්හෙ (Honghe) විශ්වවිද්‍යාලයේ නියෝජිතයින් සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂතුමා සහ පර්යේෂණ කාර්ය මණ්ඩලය අතර හමුවක් 2023 සැප්තැම්බර් මස 14 දින ආයතන පරිශ්‍රයේ දී සිදු විය.

හොන්ග්හේ විශ්වවිද්‍යාලය සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය අතර අධ්‍යාපන, පුහුණු සහ තාක්ෂණ ක්ෂේත්‍රයන් තුළ දැනුම හා අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා ඇති විභවතාවන් හා අනාගත සහයෝගීතාවයන් පිළිබඳ සාකච්ඡා කිරීම මෙම හමුවේ ප්‍රධාන අරමුණ විය.

හොන්ග්හේ විශ්වවිද්‍යාලයේ උපකුලපතිනි මහාචාර්ය ලියු යැන්ග්හොන්ග් මහත්මිය, ජාත්‍යන්තර සහයෝගිතා සහ හුවමාරු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මහාචාර්ය හූඇන්ග් වෙයි මහත්මිය සහ ගුරු අධ්‍යාපන පීඨයේ උප පීඨාධිපති මහාචාර්ය ලී කියොන්ග් යන මහත්මීහු මෙම සාකච්ඡාවට සහභාගී වූහ.



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ අංශ ප්‍රධානීන් විසින් එක් එක් පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළව සහයෝගීතා වැඩසටහන් ගොඩනගා ගැනීමේ අවස්ථා පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම මෙහිදී සිදුවිය.

ආයතනයේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ජී.ජී. බන්දුල මහතා, අතිරේක අධ්‍යක්ෂ (වැඩ බලන) ආචාර්ය එන්.පී.ජී. සමන්ත මහතා සහ පර්යේෂණ අංශ ප්‍රධානීන් ඇතුළු පර්යේෂණ කාර්ය මණ්ඩලය මෙම සාකච්ඡාව සඳහා සහභාගී වූහ.




# ආයතන කාර්ය මණ්ඩලය උදෙසා සේවක අභිප්‍රේරණ වැඩසටහනක්





**හෙ**ක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලය වෙනුවෙන් සංවිධානය කළ සේවක අභිප්‍රේරණ වැඩසටහනක් දෙසැම්බර් මස 18දින මහින්ද සිල්වා ශ්‍රවණාගාරයේ දී පැවැත්වුණි. 2024 වර්ෂයේ දී වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව රාජකාරී කටයුතු සිදු කිරීම සඳහා කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීමේ අරමුණින් වැඩසටහන සංවිධානය කර තිබුණි.



වැඩසටහන සැසි කිහිපයකින් සමන්විත වූ අතර එහි ආරම්භක සැසිය වූ ‘නව වසරේ අභියෝග ජයගැනීමට සේවක දායකත්වය’ දේශනය පවත්වන ලද්දේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ජී.ජී. බන්දුල මහතා විසිනි.

‘ආකල්ප වර්ධනය තුළින් අභියෝග ජය ගැනීම’ පිළිබඳව වන දේශනයක් අධ්‍යාපන හා පුහුණු අංශයේ අංශ ප්‍රධාන ආචාර්ය චතුර ජයම්පති මහතා විසින් සිදු කරන ලදී. පුහුණු සැසිවලින් අනතුරුව සේවක අභිප්‍රේරණ ක්‍රියාකාරකම් පැවැති අතර කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර සුහදතාව සහ එකමුතුකම වර්ධනය කිරීම කිරීම එහි අපේක්ෂාව විය.








# ශ්‍රී ලංකාවේ සැකසූ එළවළු සහ පලතුරු කර්මාන්තය: විභවතා බාධක සහ අනාගත අපේක්ෂාවන්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දත්ත කළමනාකරණ අංශය විසින් ශ්‍රී ලංකාවේ පලතුරු හා එළවළු සැකසුම් කර්මාන්තයේ වර්තමාන තත්ත්වය විශ්ලේෂණය කිරීම, සැකසුම් කර්මාන්තයේ විභවතා, බාධක, අලෙවි පද්ධති පිළිබඳ සහ දේශීය වශයෙන් සකස් කළ එළවළු හා පලතුරු කෙරෙහි ඇති පාරිභෝගික ඉල්ලීම වැනි කරුණු සොයා බැලීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කර තිබේ.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ එළවළු සහ පලතුරු කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග යෝජනා කිරීම සඳහා දේශීයව සැකසූ පලතුරු හා එළවළු අංශය සඳහා පවතින තත්ත්වය, අලෙවිකරණ පද්ධතිය, පවතින අගය දාමයන්, විභවයන් සහ බාධක විශ්ලේෂණය කිරීමයි. අර්බුදකාරී තත්ත්වයන්හි දී අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරු සැකසුම් කර්මාන්තකරුවන් විසින් ගනු ලබන උපාය මාර්ග සොයා බැලීම ද අධ්‍යයනයේ තවත් අපේක්ෂාවක් වේ.

ඉහළම නාගරික ජනගහනයක් ජීවත් වන දිස්ත්‍රික්ක තුනක් වන කොළඹ, ගම්පහ සහ මහනුවර යන දිස්ත්‍රික්ක තුනෙහි පාරිභෝගිකයින් ආශ්‍රිත ප්‍රශ්නාවලි සමීක්ෂණයක් ආධාරයෙන් සහ තෝරා ගත් එළවළු සැකසුම්කරුවන් සහ ව්‍යාපාරිකයින් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා ඇසුරින් දත්ත රැස් කිරීම සිදු කරනු ලබයි.

ක්ෂේත්‍රයට සම්බන්ධ රජයේ සහ පෞද්ගලික අංශයේ නිලධාරීන් ඇසුරින් සිදුකළ සම්මුඛ සාකච්ඡා ද මේ සඳහා උපයෝගී කර ගැනේ. ලංකාවේ ප්‍රමුඛ පෙළේ එළවළු සහ පලතුරු සැකසුම්කරුවන් සහ මෙම අංශයේ සාර්ථක කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සම්බන්ධ සිද්ධි අධ්‍යයන 12ක් ද අධ්‍යයනයට අන්තර්ගතය.

පර්යේෂණ නිලධාරින් වන අනූපා දිසානායක, ප්‍රසන්න විජේසිංහ, සංගීත් ප්‍රනාන්දු, රවීනා උදාරි, දිලිනි පෙරේරා යන මහත්ම මහත්මීන් පර්යේෂණ කණ්ඩායම ලෙස කටයුතු කරති.

# ගැඩවිල් කොම්පෝස්ට් සහ විවිධ කාබනික දියර පොහොර නිෂ්පාදනය

## න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන



**ගැඩවිල්** කොම්පෝස්ට් සහ විවිධ කාබනික දියර පොහොර නිෂ්පාදනය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික වැඩමුළුවක් 2023 දෙසැම්බර් මස 22වන දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ (**HARTI**) දී පැවැත්වුණි.
ගැඩවිල් කොම්පෝස්ට් නිෂ්පාදනය හා භාවිතය පිළිබඳ දීර්ඝ කාලයක් තිස්සේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන මාකඳුර තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ නිලධාරීන් විසින් පුහුණු වැඩසටහනේ ප්‍රධාන දේශන පැවැත්වූ අතර ප්‍රායෝගික ආදර්ශන තුළින් පොහොර නිෂ්පාදනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ද ලබා දෙන ලදි.



රේණුකා වීරක්කොඩි මහත්මිය



ආචාර්ය ප්‍රියංගා දිසානායක මහත්මිය



ආචාර්ය චන්දන ලොකුහේවගේ මහතා

ප්‍රධාන දේශනය එම ආයතනයේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය ඩී.එම්.පී.එස් දිසානායක මහත්මිය විසින් පැවැත්වූ අතර ප්‍රායෝගික පුහුණු සැසි පැවැත්වුයේ පාංශු සහ ශාක පෝෂක අංශයේ සංවර්ධන නිලධාරිනි ධමයන්ති විජේකුමාරි, බුද්ධිකා මයුරදාස, චතුරි කන්දෙමුල්ල යන මහත්මීන් විසින්ය.

පුහුණු වැඩසටහන සංවිධානය කිරීම සහ මෙහෙයවීම සිදු කරනු ලැබුයේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරිමේ ආයතනයේ අධි පර්යේෂිකා රේණුකා වීරක්කොඩි මහත්මිය විසිනි.

වැඩමුළුවට සමගාමීව අප ආයතනය විසින් ත්‍රෛමාසිකව ප්‍රකාශයට පත් කරනු ලබන ගොවිජනතා සඟරාවේ විශේෂ කලාපයක් එළි දැක්වීම ද එදින සිදු විය. ගැඩවිල් කොම්පෝස්ට් පොහාර සඳහාම වෙන් වූ ලිපි පෙළකින් යුක්ත වූ එය විශේෂ වට්ටමකට එදින අලෙවි කෙරුණි.

මෙය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මූලිකත්වයෙන් සහ මාකඳුර තිරසාර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ නිලධාරීන්ගේ මෙහෙයවීමෙන් සංවිධානය කළ ගැඩවිල් කොම්පෝස්ට් නිෂ්පාදනය හා භාවිතය පිළිබඳ තුන් වන පුහුණු වැඩසටහනයි. ගැඩවිල් කොම්පෝස්ට් භාවිතය හා නිෂ්පාදනය ප්‍රචලිත කිරීම සඳහාම නිර්මාණය කර ගෙන තිබෙන වට්ස්ඇප් සමූහය හරහා ලියාපදිංචි වූ පුහුණුලාභීහු පිරිසක් පුහුණු වැඩසටන සඳහා සහභාගී වූහ.



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ජී.ජී බන්දුල මහතා විසින් මෙම වැඩසටහන වෙනුවෙන් සම්පාදනය කළ ගොවිජනතා සඟරාවේ විශේෂ කලාපය පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ආචාර්ය චන්දන ලොකුහේවගේ මහතා වෙත පිරිනමන අයුරු



අධ්‍යක්ෂතුමා විසින් පුහුණුලභියෙකුට සහතිකපත්‍රය ප්‍රදානය කරන අයුරු

වැඩසටහනේ සමාරම්භක අවස්ථාවට සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ අවස්ථාවට ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ චන්දන ලොකුහේවගේ මහතා, ආයතනයේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය ජී.ජී බන්දුල මහතා සහ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය එන්.පී.ජී සමන්ත යන මහත්වරු සහභාගී වූහ.



# දේශගුණික විපර්යාස පුවත් ගොවීන් සහ අදාළ පාර්ශ්ව වෙත සන්නිවේදනය සඳහා අන්තර් ආයතන

## සන්නිවේදන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන

කෘෂිකර්මාන්තය හා සම්බන්ධ දේශගුණික විපර්යාස පුවත්, දැනුම, තාක්ෂණය, මතවාද ගොවිජනතාව සහ අදාළ අනෙකුත්පාර්ශවයන් වෙත නිසි පරිදි හෝ ප්‍රමාණවත් පරිදි සන්නිවේදනය නොවීම හේතුවෙන් දේශගුණික විපර්යාසවලට මුහුණදීමට, අනුවර්තනය වීමට, ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කර ගැනීමට ගොවිජනතාවට ඇති හැකියාව අවම මට්ටමක පවතී.



ශ්‍රී ලංකාව තුළ දේශගුණික විපර්යාස හමුවේ කෘෂිකර්මාන්තය මුහුණ දෙන අභියෝග ජයගැනීම හෝ කළමනාකරණය කර ගැනීම පිළිබඳ විවිධ පාර්ශ්ව දැනුවත් කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ පූර්ණ මූල්‍ය අනුග්‍රහයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ තොරතුරු සහ සන්නිවේදන අංශය විසින් වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

2023 දෙසැම්බර් මස 14 වන අප ආයතනයේ නාරායනසාමි ශාලාවේ දී පැවති වැඩමුළුව සඳහා කෘෂිකර්මාන්තය හා සම්බන්ධ රාජ්‍ය ආයතන, කෘෂිකර්මාන්තය හා සම්බන්ධ පෞද්ගලික සමාගම්, මාධ්‍ය ආයතන, විශ්වවිද්‍යාල, ජාත්‍යන්තර රාජ්‍ය නොවන ආයතන සහ දේශීය ප්‍රජා සංවිධානවල නියෝජිතයෝ රැසක් සහභාගී වූහ. මෙම වැඩමුළුව වෙනුවෙන් සම්පාදනය කළ දේශගුණික විපර්යාස - නිතර අසන ප්‍රශ්න අත්පොත පිළිගැන්වීම ද මෙම අවස්ථාවේ සිදුවිය.




HARTI අධ්‍යක්ෂතුමා විසින් මෙම වැඩසටහන වෙනුවෙන් සම්පූර්ණ මූල්‍ය අනුග්‍රහය දැක්වූ ශ්‍රී ලංකා රතු කුරුස සමාජය නියෝජනය කරමින් පැමිණි උදාරී සමරකෝන් මෙනෙවිය වෙත දේශගුණික විපර්යාස අත්පොත පිරිනමන අයුරු



ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සිදත් බණ්ඩාර මහතා දේශගුණික විපර්යාස මගින් කෘෂිකර්මාන්තයට සිදුවන බලපෑම මැයෙන් වූ විශේෂ දේශනය සිදුකරමින්





















# සේවක අභිප්‍රේරණ වැඩමුළුවේ විශේෂ අවස්ථා




## සන්නිවේදනය පිළිබඳ පුහුණුවක්

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ විශේෂ ඉල්ලීමක් මත සංවර්ධන සන්නිවේදනය පිළිබඳ විශේෂ වැඩමුළුවක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ තොරතුරු හා සන්නිවේදන අංශය විසින් සංවිධානය කරන ලදී.

වැඩමුළුවට සමගාමීව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව තුළ විශේෂ අධ්‍යයන චාරිකාවක් ද සංවිධානය කර තිබුණි. පුහුණු වැඩමුළුව සඳහා කිසිදු මූල්‍ය පිරිවැයක් නොදැරීම විශේෂත්වයකි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ සිසුසිසුවියන් අට දෙනෙකු සහ විෂය භාර ආචාර්යතුමිය ඇතුළු පිරිසක් මේ සඳහා සහභාගී වූහ.

මෙම පුහුණු වැඩසටහන වෙනුවෙන් සංවර්ධන සන්නිවේදන නිපුණතා සහ කුසලතා නමින් අත්පොතක් ද ප්‍රකාශයට පත්කරන ලදී.






# ජාතික විද්‍යා දින සැමරුම සහ පොත් ප්‍රදර්ශනය

නොවැම්බර් 10වෙනි දිනට යෙදෙන ජාත්‍යන්තර විද්‍යා දිනයට සමගාමීව ජාතික විද්‍යා දින සැමරුම සහ ප්‍රදර්ශනය කොළඹ ජාතික ස්වාභාවික ඉතිහාස කෞතුකාගාරය කේන්ද්‍ර කරගනිමින් පැවැත්වුණි.

'විද්‍යාත්මක සවිබල ගැන්වීම තුළින් සෞභාග්‍යය කරා' යන්න මෙවර එහි තේමාවයි. නොවැම්බර් මස 8, 9 සහ 10 යන දිනයන්හි පැවති ප්‍රදර්ශනය තාක්ෂණික තේමා කලාප 10කින් සමන්විත වූ අතර පාසල් සිසුන්ගේ දැනුම වර්ධනය කිරීමේ වැඩසටහන් සහ අධ්‍යාපන අමාත්‍යංශයේ සහයෝගීතාවෙන් යුතුව සිදු කරන විද්‍යා තාක්ෂණ හා නව්‍යකරණ ක්ෂේත්‍රයට අදාළ වැඩසටහන් රාශියකින් ද ප්‍රදර්ශනය සමන්විත විය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ද අලෙවි කුටියක් ප්‍රදර්ශන භූමියේ පිහිටුවා තිබූ අතර ඒ හරහා අප ආයතනයේ ප්‍රකාශන මිල දී ගැනීමේ හැකියාව සලසා තිබුණි. එසේම ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි පිරිසට අප ආයතනයේ කාර්යභාරය සහ අප ආයතනයෙන් සලසා ගත හැකි සේවාවන් පිළිබඳ දැනුවත් කිරීමක් ද සිදු කරන ලදී.

# මාසික දේශන මාලා: සිව්වන කාර්තුව

## සංවිධානය අධ්‍යාපන හා පුහුණු අංශය









# ගොවිකටයුතු පුවත් හසුන




*උපදේශකත්වය*

ආචාර්ය ජී.ජී බන්දුල
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

*අධීක්ෂණය*

ශාන්ත හේවගේ
අංශ ප්‍රධාන
තොරතුරු හා සන්නිවේදන අංශය

*සම්පාදනය*

වසන්ති රාජපක්ෂ
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී

*ගොවිකටයුතු පුවත්හසුන ප්‍රකාශනය, මුද්‍රණය සහ බෙදා හැරීම*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

**0112 696981 - 0112 692423**

www.harti.gov.lk
https://www.facebook.com/hartilk
https://www.instagram.com/harti_lk/
http://twitter.com/harti_lk




හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මගින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ගොවිකටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා පුහුණු වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ හා පුහුණු තොරතුරු මෙමගින් ප්‍රකාශයට පත් කෙරේ.

ලබා ගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකිය.